


ජනමාධ්‍ය
ගවේෂණාත්මක
පැහැදිලිව
සංවේදීබව
පෙළගැස්ම
වෘත්තීය
අයිතීන්
නියාමනය
පෙරළිකාරීත්වය
ප්‍රේක්ෂක විශ්වසනීයත්වය
ආචාරධර්ම
ආකල්ප
මර්දනය
හෘද සාක්ෂිය
සමබරව
වාරණය
වාරණය
ආයතන ප්‍රධානීන්
මූලාශ්‍රවල රහස්‍යභාවය
ප්‍රතිපත්ති
අභියෝග
නිර්මාණාත්මකබව
සමාජ ආකල්ප
ජයගැනීම
භාෂණයේ නිදහස
තර්ජන
ජාත්‍යන්තර සම්මුතීන්
සත්‍යය සහ අවබෝධය
කුතුහලය
තහනම
අතික්‍රමනය
මහජන මතය
අවධානය
තොරතුරු



© රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

ISBN 978-955-9073-20-8

ප්‍රධාන සංස්කාරක
**මහාචාර්ය ආරියරත්න ඇතුගල**

සංස්කරණය
**මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය විජයානන්ද රූපසිංහ**

නිර්මාණ සැලසුම
**අනුහස් මහවලගේ**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

*2013 මැයි 03 දිනට යෙදෙන*
*ලෝක නිදහස් මාධ්‍ය දිනය සැමරුමේ*
*විසි වැනි සංවත්සරය වෙනුවෙන් ද,*
*කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශයට*
*හතළිස් වසරක් පිරීම හා*
*දෙසතිය සඟරාවට තිස්පස් වසරක් පිරීම ද සමරමින්*
*ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන්*
*‘2010 ජාතික ජනමාධ්‍ය සමුළුවේ දී’ පිහිටුවා ගත්*
*විශ්වවිද්‍යාල ජනසන්නිවේදනය පිළිබඳ*
*ආචාර්යවරුන්ගේ සංගමයේ ශාස්ත්‍රීය දායකත්වයෙන්*
*මෙම කෘතිය එළිදැක් වේ.*

–

**විජයානන්ද රූපසිංහ**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**
ජනසන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය



# ශ්‍රී ලංකාවේ ගුවන්විදුලි මාධ්‍යය හිමිකාරිත්වය හා පාලනය

## පසුබිම

ජනමාධ්‍යයක් රටකට හඳුන්වා දීමේ දී එහි හිමිකාරිත්වය පිළිබඳවත් එහි පාලනය පිළිබඳවත් දීර්ඝ ලෙස සාකච්ඡාකවට ලක් වූ අවස්ථාවක් ලෙස ශ්‍රී ලංකාවට ගුවන්විදුලිය හඳුන්වා දීම ගත හැකි ය. එමෙන් ම මෙරට ක්‍රියාත්මක සෙසු ජනමාධ්‍යවලට සාපේක්ෂ ව වැඩිම වාර ගණනක් විවිධ කොමිෂන් සභා මඟින් විමර්ශනයට භාජනය කළ මාධ්‍යය වන්නේ ද ගුවන්විදුලිය යි. එමගින් ගුවන්විදුලි මාධ්‍යයට අදාළ ප්‍රතිපත්ති සකස් වුව ද විවිධ සිද්ධි අධ්‍යයනය කිරීමේදී පෙනී යන්නේ ගුවන්විදුලි මාධ්‍යයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විවධ ගැටලුකාරී තත්ත්වයන් බලපා ඇති බව යි. ජනමාධ්‍ය නියාමන ක්‍රියාවලියට පසුබිමක් සකස් කර ගැනීමත් ආචාරධර්ම හා මාර්ගෝපදේශ පද්ධති ගොඩනැඟීමකින් තොර ව කටයුතු කිරීමෙන් මෙරට ගුවන්විදුලි ක්‍රියාකාරීත්වය පහසුවෙන් වාරණ ක්‍රියාවලියකට නතු වන බව පෙන්වා දිය හැකි ය.

## ගුවන්විදුලි හිමිකාරිත්වය

මෙරට ගුවන්විදුලි මාධ්‍ය ආරම්භ වීමට පදනම සකස් වනුයේ යටත් විජිත පාලන සමයේය. ඊට මුල් වන්නේ නව මාධ්‍යය පිළිබඳ උනන්දුවකින් පසු වූ තරුණ කණ්ඩායමකි. 1922 දී පිහිටුවා ගන්නා ලද "ලංකා වයර්ලස් සමාජය" එහි මුල් පියවර විය. පසුව එය "ලංකා ආධුනික රේඩියෝ සමාජය" බවට නම් කෙරුණි. මෙරට ගුවන්විදුලි මාධ්‍යය ආරම්භ කිරීමේ පළමු ඉල්ලීම ඉදිරිපත් වූයේ එම සමාජය මඟිනි. ඒ පිළිබඳ තීරණය කිරීමට පෙර පරීක්ෂා කර බැලීම යටත් විජිත පාලනයේ අපේක්ෂාව විය. එම නිසා එවකට සිටි තැපැල්පතිවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවකට එම ඉල්ලීම පරීක්ෂා කර බැලීමට යොමු කරනු ලැබී ය. මෙරට ගුවන්විදුලි මාධ්‍යයේ හිමිකාරිත්වය පිළිබඳ සාධකය පළමුවරට සාකච්ඡා වන්නේ එකී කමිටුව තුළිනි. කමිටුවට පැවරුණ කාර්යය වූයේ,

(අ) ලංකාවේ ගුවන්විදුලි ප්‍රචාරක කටයුතු ආරම්භ කළ යුතු ද?

(ආ) එසේ නම් ආරම්භ කළ යුත්තේ රජය මඟින් ද? නැතහොත් පෞද්ගලික ව ද?

(ඇ) පෞද්ගලික ව නම් බලපත්‍ර නිකුත් කළ යුත්තේ එක් සමාගමකට ද? නැතහොත් සමාගම් කීපයකට ද?

(ඈ) ගුවන්විදුලි ප්‍රචාරක කටයුතු පාලනය කිරීමට මණ්ඩලයක් පත්කළ යුතු ද? එසේ නම් එය තෝරාගත යුත්තේ කෙසේ ද?

මෙහි (අ) හා (ඇ) යන කොටස් දෙක ම හිමිකාරිත්වය පිළිබඳ ප්‍රශ්නය මතු කරයි. රජයේ තීරණය වූයේ තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව යටතේ ගුවන්විදුලිය පාලනය විය යුතු බව යි. (කොළඹගේ 1980: 7) ඒ සඳහා පූර්වාදර්ශය වූයේ ප්‍රංශය, ජර්මනිය, අයර්ලන්තය, ඩෙන්මාර්කය හා දකුණු අප්‍රිකාව යන රටවල් ගුවන්විදුලිය එම රටවල තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීම යි. එහෙත් එක්සත් රාජධානියේ ගුවන්විදුලි සේවාවක් ආරම්භ කිරීමේ බලය 1922 මැයි මස පවරන ලද්දේ මාර්කෝනි සමාගමට ය. (Gunawardana; 1990: 17) එය පෞද්ගලික සමාග මක් වුවත් තම යටත් විජිතයේ ගුවන්විදුලි මාධ්‍ය ඇරඹීමට නිර්දේශ කරමින් කමිටුව පෙන්වා දුන්නේ එය රජය යටතේ පැවැත්විය යුතු බව යි.

01. ලංකාවේ ගුවන්විදුලිය ආරම්භ කළ යුතු අතර ඊට අදාළ සියලු පහසුකම් ද ජනතාවට සැපයිය යුතු ය.
02. එය රජය යටතේ පැවැතිය යුතු නමුත් රජය මගින් ම පාලනය කළ යුතු නොවේ. සකස් කරගනු ලබන නියමයන් යටතේ ගුවන්විදුලිය පෞද්ගලික ව්‍යාපාරයකට පැවරිය හැකි ය.

මේ ආකාරයට පෞද්ගලික අංශයට ද යම් ඉඩකඩක් මේ මාධ්‍යයෙන් ලබා දීමට කමිටුව නිර්දේශ කළේ ය. ශ්‍රී ලංකාවේ ගුවන්විදුලි මාධ්‍ය ප්‍රතිපත්තිය තුළ හිමිකාරිත්වය සම්බන්ධයෙන් කරනු ලැබූ මේ නිගමනය මාධ්‍යයේ ඉදිරි ගමනට බොහෝ සෙයින් ප්‍රයෝජනවත් විය. (Karunananayake, 1990, 85). එමෙන් ම පෞද්ගලික සමාගමක ඒකාධිකාරයට ගුවන්විදුලිය නතු කිරීම ද කමිටුව ප්‍රතික්ෂේප කළේ ය.

"The grant of a monopoly to a single company was not recommended. A monopoly was considered bad in principle" (Papers, 1941, 06)

කමිටුවේ නිර්දේශය සඳහා අනුමැතිය ලබා දුන් රාජ්‍ය දෙපාර්තුමේන්තුව 1924 මැයි 24 දින ඒ බව නිවේදනය කළේ ය. මේ අනුව 1925 දෙසැම්බර් මස සිට ලංකා ගුවන්විදුලියේ විකාශන කටයුතු ආරම්භ කෙරිණි. ගුවන්විදුලිය පාලනය වූයේ තැපැල්පති යටතේය. ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරුවරයාගේ මෙහෙයවීමෙන් විකාශන කටයුතු සිදු කෙරිණි. විෂයභාර අමාත්‍යවරයා වූයේ ප්‍රවාහන හා කර්මාන්ත ඇමති ජෝන් කොතලාවල ය.

1949 ඔක්තෝබර් මස සිට ලංකා ගුවන්විදුලි සේවය වෙන ම රාජ්‍ය දෙපාර්තමේන්තුවක් බවට පත් විය. ඒ අනුව ගුවන්විදුලි අධ්‍යක්ෂ යටතේ පාලනය ආරම්භ කෙරිණි. පසුව මෙම තනතුර අධ්‍යක්ෂ ජනරාල් ලෙස වෙනස් විය. මේ වන විට විෂයභාර අමාත්‍යාංශය වූයේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශය යි.

1962 දී ගුවන්විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව එක් දෙපාර්තමේන්තුවක් බවට පත්විය. 1967 ජනවාරි මස සිට ලංකා ගුවන්විදුලි සංස්ථාව ලෙස නිල වශයෙන් ගුවන්විදුලිය ස්ථාපිත කෙරිණි. ප්‍රථම සභාපති හා අධ්‍යක්ෂ ජනරාල් වූයේ නෙවිල් ජයවීර ය. සංස්ථාවට පත්

කරන ලද පුද්ගලයන් දෙස බැලීමේ දී බොහෝ විට දේශපාලන සබඳතා හා පක්ෂපාතිත්වයන් පෙන්නුම් කළ බව හඳුනාගත හැකි ය.

1988 - 89 කාල වකවානුවේ දී මතු වූ තරුණ කැරලිකාරිත්වය පිළිබඳ සාකච්ඡාවේ දී ගුවන්විදුලි මාධ්‍ය පිළිබඳ ව තොරතුරු සාකච්ඡා කෙරිණි. එකල පැවති සර්ව පාක්ෂික සමුලුවේ දී මෙරට ගුවන්විදුලිය රාජ්‍ය ඒකාධිකාරයක් ව පැවතීම පිළිබඳ විවිධ විවේචන මතුවිය. පසුව තරුණ කොමිසම මගින් ද මාධ්‍ය බහුවිධකරණය පිළිබඳ කරුණු දක්වා තිබුණි. ඒ ඔස්සේ පෞද්ගලික ගුවන්විදුලි සේවා ඇරඹීමට අවශ්‍ය කටයුතු විමසා බැලීමට ජනාධිපති ආර්. ප්‍රේමදාස 1990 මාර්තු මස කමිටුවක් පත් කරන ලදී. එකී කමිටුවේ නිර්දේශ මත 1992 දී පෞද්ගලික ගුවන්විදුලි සේවා සඳහා බලපත්‍ර නිකුත් කෙරිණි.

## ගුවන්විදුලි ප්‍රතිපත්ති

ශ්‍රී ලංකාවේ ගුවන්විදුලි මාධ්‍යයට අදාළ කොමිෂන් සභා එහි ආරම්භයේ සිට ම වරින් වර පත් කෙරුණි. 1941, 1953, 1966 සහ 1972 එවැනි කොමිෂන් සභා පත් කරනු ලැබූ වර්ෂ ලෙස දැක්විය හැකි ය. මේ සෑම කොමිෂන් සභා වාර්තාවක ම ගුවන්විදුලියේ පාලනය කෙසේ සකස් විය යුතු ද යන්න සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරි පත් ව තිබුණි.

1941 පත් කරනු ලැබූ කොමිසම එහි වාර්තාවන් ගුවන්විදුලියේ පාලනයට අදාළ කරුණු සාකච්ඡා කර තිබුණි. මෙරට ගුවන් විදුලිය ආරම්භයේ දී ම එහි පාලනය තැපැල්පති යටතේ විය. ඔහුගේ සභාපතිත්වයෙන් යුත් මණ්ඩලයක් ද පත් කිරීමට යෝජනා විය. එහි සමන්විත වූයේ පුවත්පත් නියෝජිතයෙක්, ලංකා රේඩියෝ සමාජයේ උප ප්‍රධානියා, විදුලි භාණ්ඩ අලෙවිකරුවන් ගේ නියෝජිතයා, වෙළඳ සමාජයේ නියෝජිතයා සහ නියෝජ්‍ය පොලිස්පතිවරයා ය. ඒ අනුව හය දෙනකුගෙන් යුත් පාලන මණ්ඩලයේ තීරණ ගැනීමට අවම වශයෙන් තිදෙනකුගේ ගණ පූර්ණයක් තිබිය යුතු බව නියම කෙරිණි.

මෙම මණ්ඩලයට අමතර ව නව උපදේශක මණ්ඩලයක් පත් කිරීමට කොමිසම යෝජනා කර තිබුණි. (Report of the commission ...; 1941, p. 29)

1953 පත් කරන ලද කොමිෂන් සභාව ගුවන්විදුලියේ පාලනය පිළිබඳ යෝජනා ඉදිරිපත් කළේ ය.

“Radio Ceylon should continue to remain atleast for another 10 years as a Government Department under the general supervision and control of a broadcasting control board” (Report of the commission ...; 1955, p. 142)

මෙසේ පත්කළ යුතු යැයි යෝජනා කරන මණ්ඩලයේ සංයුතිය පිළිබඳ මෙසේ නිර්දේශ කර තිබුණි.

“We recommend the appointment of a broadcasting control broad consisting of the permanent secretary of the ministry in charge of broadcasting as a chairman and director of broadcasting and a Treasury representative as members” (Report of the commission ...; 1955, p. 142)

මූල්‍ය හා පරිපාලන තීන්දු ගැනීම් ක්‍රියාවලිය වඩා ක්‍රමවත් හා වේගවත් කිරීම මෙහි අරමුණ වූ බව පෙනේ. ගුවන්විදුලිය පාලනයට බ්‍රිතාන්‍ය හා ඇමරිකානු ආදර්ශයන් නොගැලපෙන බව ද කොමිසම පෙන්වා දේ. විශේෂයෙන් BBC වැනි පාලක සභාවකින් පාලනය කිරීම ද සුදුසු නොවන බව කොමිසමේ අදහස යි.

1966 ගුවන්විදුලි හා ප්‍රවෘත්ති කොමිෂන් සභා වාර්තාවට අනුව ගුවන්විදුලිය නීතිගත සංස්ථාවක් බවට පත්කර ලීමට නිර්දේශ කර තිබුණි. ඒ සඳහා යොදාගත හැකි පනත නවසීලන්ත ගුවන්විදුලි පනත ආශ්‍රයෙන් සකස්කර ඉදිරිපත් කෙරිණි. (Report of the commission ...; 1966, p. 100)

**නිර්දේශවල සාරාංශය**

පස්වන පරිච්ඡේදය : ගුවන්විදුලිය නීතිගත සංස්ථාවක් බිහිකිරීම.

(ඡේදය 65)

බ්‍රිතාන්‍ය ගුවන්විදුලි සංස්ථාවේ මෙන් සම්පූර්ණ බලතල සහිත ව නොව, නවසීලන්ත ගුවන්විදුලිය සංස්ථාවට අනුරූප ව ගුවන්විදුලි සංස්ථාවක් පිහිටු විය යුතු ය.

ඡේදය 69

නීතිගත සංස්ථාවේ මණ්ඩලය, අග්‍රාමාත්‍ය තුමාගේ නිර්දේශය පරිදි අග්‍රාණ්ඩුකාරතුමා විසින් පත් කරනු ලැබිය යුතු වන අතර, එය

සාමාජිකයින් පස් දෙනකුගෙන් සමන්විත විය යුතු ය. ඔවුන්ගෙන් එක් අයකු සභාපති විය යුතු ය. සභාපතිගේ සේවා කාලය අවුරුදු 5ක් විය යුතු අතර අනෙකුත් අයගේ සේවා කාලය අවුරුදු හතරක් විය යුතු ය.

ඡේදය 71
සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්‍ෂ ජනරාල්වරයා අවුරුදු හතරක කොන්ත්‍රාත්තුවක් පිට මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු ය. එම තනතුර රජයේ සේවකයන්ට සීමා නොකළ යුතු ය.

කොමිෂමේ නිර්දේශවලට අනුව එය බ්‍රිතාන්‍යයේ BBC මෙන් නොවිය යුතු බව විශේෂිත ව (65 ඡේදය) දන්වීමෙන් සංස්ථාගත කිරීමේ දී රජයට එය ඍජු ලෙස පාලනය කිරීමට අවශ්‍ය පසුබිම සකස් කරනු ලබයි.

කෙසේ වුව ද කොමිෂමේ නිර්දේශය පරිදි 1966 අංක 37 දරන ලංකා ගුවන් විදුලි පනත 1966 නොවැම්බර් මස 15 දින සම්මත කෙරුණි.

සංස්ථාව සටහන් ඉදිරිපත් වන වැඩසටහන් හි සමබරතාවන්, අපක්‍ෂපාතිත්වයන් පිළිබඳ පනතේ දෙවන වගන්තිය යටතේ කරුණු දක්වා තිබුණි.

2. (b) That the Programmes maintain a proper balance in their subject matter and a high general standard of quality, and

(c) That any news given in the programmes (in whatever form) is presented with due accuracy and impartiality and with due regard to the public interest.

පනතේ මෙසේ දැක්වුන ද, ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමේ දී පැවති රජයට පූර්ණ පක්‍ෂපාතිත්වයන් දැක්වූ බව හඳුනාගත හැකි විය.

සංස්ථාවේ පාලක මණ්ඩලයට අදාළ වගන්තිය වනුයේ 6 වන වගන්තිය යි.

6 (1) The corporation Shall consist of five members appointed by the minister, one of whom shall be designated the chairman of the corporation.

මෙහි දී පත් විය යුතු පුද්ගලයන්ගේ තරාතිරම ඔවුන්ගේ සුදුසුකම් ආදී කිසිවක් දක්වා නොතිබීමෙන් ඇමතිවරයාට තමන්ට පාලනය කළ හැකි දේශපාලන හිතවතුන් පත් කිරීමේ පුලුල් ඉඩකඩක් සපයයි.

මේ තත්ත්වය ඇති විය හැකි බව කොමිසම කල් තබා නිරීක්ෂණය කර තිබුණි. "දේශපාලනයෙන් වෙන්වීම" යනුවෙන් ඡේද හතරකින් යුත් කොටසක් වාර්තාවේ දැක්වේ.

"බලයෙහි සිටින රජය මගින් පත් කරනු ලබන මණ්ඩලයක් පක්ෂයට අනුකූලතාව දක්වන්නන්ගෙන් සහ රජයට කරන ලද සේවයට යම්කිසි වරප්‍රසාදයක් ලැබිය යුතු ව සිටින පුද්ගලයන්ගෙන් ද පිරී යනු ඇත. යනුවෙන් පවත්නා බිය ද නොසලකා හැරීමට අපට නොහැකි ය." (Report of the commission ...; 1966, p. 82)

1972 ගුවන්විදුලි සංස්ථාව පිළිබඳ කොමිෂන් සභාව ආයතනයේ පරිපාලන ව්‍යුහය හා ප්‍රධාන පාලක නිලධාරීන් හා සම්බන්ධ නිර්දේශ ගණනාවක් දක්වා තිබේ.

1. A change is recommended so that one person will not be both Chairman. C.B.C and Director - General. The separation of function is proposed.
2. The person to be appointed D/G should be one in the C. A. S. Class I. He should have good personality, ability to appreciate music and drama and considerable experience.
3. An increase in the number of members of the corporation is suggested. In a democracy there is safety in numbers.
4. The Corporation should consist of seven members instead of five as at present. There should be three ex office members the P.M.G , the Director of Information and the director of Cultural Affairs.

කොමිසමේ සාමාජිකයකු වූ මර්වින් ද සිල්වා ප්‍රධාන වාර්තාවට අමතර ව ස්වාධීන වාර්තාවක් ද ඉදිරිපත් කළේ ය. එහි ඇතැම් යෝජනා හා පාලනය පිළිබඳ අදහස් ප්‍රධාන වාර්තාවට වඩා වෙනස් මඟක් ගනී.

1. The board must accept full responsibility for the entire working of the Corporation, but must only define policy. They must not attend to executive function which must be left to the Director - General.

2. The chairman of the Corporation must be a full-time officer who must be available to the Director-General for advice and guidance at all times of the day and night for in the business of broadcasting one never knows when something may happen that will make it necessary to alter the whole of the next day's programme. He should communicate policy to the Director-General who will be the chief executive. The Chairman must supervise the working of the Director - General, hear appeals from decisions of the Director - General and generally act as the link between the broad of the Corporation and the Administrations.

3. The board must be free to select the Director - General form wherever it be. To my mind the most suitable field of recruitment will be the private sector. His first requirement must be political loyalty to the Government in power. His understanding of politics in this country must be of a very high order. His understanding the capacity to understand the politicians and anticipate events long before they happen. He need not be a broadcaster. He has only to be an administrator.

ගුවන්විදුලි මාධ්‍යයේ පක්ෂපාතිත්වය විමසා බලන ප්‍රධාන වැඩසටහනක් වන්නේ ප්‍රවෘත්ති ප්‍රකාශය යි. රාජ්‍ය මාධ්‍යය වශයෙන් ආරම්භයේ දී ඉදිරිපත් කරනු ලබන ප්‍රවෘත්ති මගින් රජය හා ඇමතිවරුන්ගේ ක්‍රියා කලාපයන් යම්තාක් දුරට විවේචන වූ බව පෙනේ. ඊට හේතුව ගුවන්විදුලි ප්‍රවෘත්ති සඳහා මුල් භාගයේ දී පුවත්පත් මූලාශ්‍රය ලෙස යොදා ගැනීම යි. මේ තත්ත්වය 1941 කොමිෂන් සභාව විස්තර කර තිබේ.

"We were told of an instance of an item of Government news broadcast by the station as it appeared in a Newspaper and which was subsequently found to be entirely without foundation. This was undoubtedly an awakward situation because being a Government station the public had every reason to believe that its service of government news was authentic. There was also an instance when some press criticism of the policy of an officer of state had been taken

over from the news papers and broadcast under News from the station" (Report of the commission...; 1972, p. 38)

ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමේ දී ආයතනයේ පරමාර්ථ හා අපක්ෂපාතිත්වය අතර ගැටුම 1965 කොමිෂන් සභා වාර්තාව මගින් ද පෙන්වා දී තිබේ. "ප්‍රවෘත්ති අංශය මුහුණ පාන වඩා අමාරු ගැටලුව වන්නේ මූලික පරමාර්ථත්. බලයේ සිටින රජයේ මහජන සැලකිල්ල යන්න අතර නියම තුලනාත්මකතාවක් පවත්වාගෙන යාම යි." (Report of the commission ...; 1966, P. 63 - 64)

ගුවන්විදුලි මාධ්‍යය රටේ පැවති ප්‍රබල මාධ්‍යයක් වීම හේතුවෙන් රජය ඒ සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ලක් දැක්වීය. ඇතැම් අවස්ථාවල අභ්‍යන්තර ගැටුම් මත ගුවන්විදුලි විෂය පැවතිය යුත්තේ කුමන අමාත්‍යාංශයක් යටතේ ද යන්න පිළිබඳ ව වෙනස් ප්‍රතිපත්ති අනුගමනය කළ බව පෙනේ. උදාහරණ ලෙස අග්‍රමාත්‍ය ඩඩ්ලි සේනානායක හා රාජ්‍ය ඇමති ජේ. ආර්. ජයවර්ධන අතර ගැටුම් ඇති වූ විට 1967 ජනවාරි 05 වැනි දින ගුවන්විදුලි විෂය අගමැතිවරයා යටතට ගත් ආකාරය දැක්විය හැකිය.

එමෙන්ම 8 වැනි වගන්තියෙන් කිසිදු හේතු දැක්වීමකින් තොර ව මණ්ඩලයේ සාමාජිකයින් ඉවත් කරලීමට ද ඇමතිවරයාට බලතල පවරා තිබේ. මේ අනුව පූර්ණ ලෙස විෂයභාර ඇමතිවරයාගේ පාලනයට සංස්ථාව නතු කර තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් යෝජනා කර ඇමතිවරයාගෙන් නිර්දේශය මත අධ්‍යක්ෂ ජනරාල්වරයා එනම්, ප්‍රධාන විධායක නිලධාරියා පත් කිරීමට 19 වැනි වගන්තියෙන් කටයුතු කර තිබේ.

සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ ජනරාල්වරයා වූයේ නෙවිල් ජයවීර යි. මෙහි දී පරිපාලනය පිළිබඳ ව ද මූලික සුදුසුකම්, මාධ්‍ය විශේෂඥභාවය මෙන්ම දේශපාලන පක්ෂපාතිත්වය ද බලපෑ බවට විශ්වාස කළ හැකි ය. මේ තත්ත්වය වර්තමානය වන තෙක් ඒ අකාරයෙන් ම පවතී.

පනතේ 44 වන වගන්තිය යටතේ පෞද්ගලික ආයතනවලට විකාශන බලපත්‍ර ලබා දීමේ අයිතිය ඇමතිවරයාට පවරා තිබුණි. එමෙන්ම එහි 4 වන අනු වගන්තිය යටතේ ඊට අදාළ නියාමනයන් පැනවිය හැකි ක්ෂේත්‍රයන් හා  අවස්ථා දැක්විණි.

44 (4) Regulations may be made by the minister in respect of all or any of the following matters-

(a) The procedure to be followed in respect of applications to be made, and the hearing of inquire into applications, for the issue of licences under this section.

(b) The control and supervision by the corporation of programmes broadcast from private broadcasting stations,

(c) The furnishing or disclosure by any body of persons applying for a licence under this section of information relating to such body and of its members,

(d) The prohibition, regulation or control of the ownership of private broadcasting stations by prescribed persons or classes of persons,

(e) The regulation or control of the transfer hold licences for private broadcasting stations and the transfer of interests on such stations,

පෞද්ගලික ආයතන සඳහා බලපත්‍ර ලබාදෙනු ලැබුව ද ඒවා ඍජු ලෙසට පාලනය කිරීමේ හැකියාව ඇමතිවරයා සතු වූ බව (d) සහ (e) ඡේද මගින් පෙන්වා දිය හැකි ය. ගුවන්විදුලිය හා සම්බන්ධ පලනය පිළිබඳ ව වන බොහෝ කොටස් සාකච්ඡා වනුයේ රූපවාහිනී මාධ්‍යයන්ටත් අදාළ ව පොදුවේ විද්‍යුත් මාධ්‍ය වශයෙනි. එමනිසා පොදුවේ විද්‍යුත් මාධ්‍ය පාලනයට රජය මැදිහත් වූ ආකාරයන් හා ඊට අදාළ ප්‍රතිපත්තිමය කරුණු සාකච්ඡා කිරීම වැදගත් වේ.

පුවත්පත් සඳහා පවතින ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය වැනි විද්‍යුත් මාධ්‍ය සඳහා බලපානු ලබන නීතිමය බලතල සහිත ආයතන ව්‍යුහයක අවශ්‍යතාව විවිධ අවස්ථාවල දී මතු කෙරිණි. විශේෂයෙන් රූපවාහිනී මාධ්‍යය ජනප්‍රිය ව පැවැති 80 දශකයේ අග භාගයේ දී මේ සම්බන්ධ අදහස් ඉදිරිපත් විය. 1990 දී ජනාධිපති රණසිංහ ප්‍රේමදාස ගේ ප්‍රධානත්වයෙන් රැස් වූ සර්ව පාක්ෂික සමුළුව (APC) තුළ ද මේ අදහස් සාකච්ඡා විය. ඒ අනුව එම වසර අවසානය වන විට "ජනමාධ්‍ය කොමිසම" පිහිටුවීමට පනත් කෙටුම්පතක් සකස් කෙරිණි.

ජනමාධ්‍ය සඳහා අහිතකර ලෙස බලපෑ හැකි වගන්ති එහි ඇතුළත් වූ බැවින් මානව හිමිකම් සංවිධාන හා ජනමාධ්‍ය සංවිධාන ඊට විරෝධය පළ කරන ලදී. කෙසේ වුව ද පුවත්පත් මණ්ඩලයේ දිගුවක් ලෙස ජනමාධ්‍ය මණ්ඩලයක් පිහිටුවීමේ අදහස පසු කාලීන ව ද සාකච්ඡාව ට බඳුන් විය. 1996 දී නිකුත් වූ ආර්. කේ. ඩබ්. ගුණසේකර කමිටු වාර්තාවේ එවැනි මණ්ඩලයක් පිහිටුවීමට නිර්දේශ ඉදිරිපත් කර තිබුණි. (Gunasekara, 1995, P. 40, 42)

විකාශන අධිකාරියක් පිහිටුවීමට 1997 දී ඉදිරිපත් වූ පනත් කෙටුම්පත ද විද්‍යුත් මාධ්‍ය පාලනය විෂයේ දී ප්‍රබල වැදගත්කමකින් යුක්ත වේ. 1997 අප්‍රේල් මස 10 වන දින ශ්‍රී ලංකා විකාශන අධිකාරිය නමින් නිකුත් වූ පනත් කෙටුම්පතක් හඳුන්වා තිබුණේ මෙසේ ය. "...ගුවන්විදුලි හා රූපවාහිනී විකාශන මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා අධිකාරිය නම් වූ අධිකාරියක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද එම කාර්ය සඳහා බලපත්‍ර නිකුත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඊට සම්බන්ධ හා ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි."

මෙම කෙටුම්පත සකස් කිරීමට පදනම සකස් වූයේ පෞද්ගලික විද්‍යුත් මාධ්‍යවල ක්‍රියාකාරිත්වය විමසා බැලීමේ අවශ්‍යතාව විවිධ කොටස් විසින් මතු කිරීමෙන් පසුව ය. ජනාධිපති ඩී. බී. විජේතුංග 1993. 08. 30 දින ජනාධිපති අතිරේක ලේකම් චන්ද්‍ර වික්‍රමසිංහ ගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කරන ලදී. එම කමිටුව ඉදිරිපත් කළ වාර්තාව සලකා බැලූ කැබිනට් මණ්ඩලය විකාශන අධිකාරියක් සඳහා නව පනත් සකස් කිරීමට අනුමැතිය පළ කරන ලදී. කෙසේ වුව ද ඒ ඔස්සේ සකස්කර ඉදිරිපත් කරනු ලැබූ පනත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බැවින් පාර්ලිමේන්තුවේ 2/3 ක ඡන්දයෙන් හා ජනමත විචාරණයෙන් සම්මත කරගත යුතු බව ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කෙරිණි.

## සිද්ධි අධ්‍යයනය

ශ්‍රී ලංකාවේ ගුවන්විදුලි පාලනය යටතේ පසුගිය දශක දෙක තුළ මතු වූ සිද්ධි ඇසුරින් මෙරට ගුවන්විදුලි මාධ්‍යයේ හැසිරීම් රටාව පිළිබඳ අධ්‍යයනය කළ හැකි ය. ඒ සඳහා යොදාගත හැකි ප්‍රධාන සිද්ධි 5කි.

1. නව අධ්‍යාපන සේවය තහනම් කිරීම
2. කොටි හඬ සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම
3. ඌව ප්‍රජා ගුවන්විදුලිය හා 2004 මහ මැතිවරණය
4. රජ එෆ්. එම්. තහනම් කිරීම
5. ABC මාධ්‍ය ජාලය තහනම් කිරීම

## නව අධ්‍යාපන සේවය තහනම් කිරීම

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව වැඩසටහන්කරණයේ දී අනුගමනය කරනු ලබන්නේ පවත්නා රජයට පක්ෂපාති ව කටයුතු කිරීමේ පිළිවෙත යි. (ගුවන්විදුලි සංස්ථා පනතේ ඊට අවශ්‍ය විධිවිධාන හා බලතල ඇමතිවරයා වෙත පවරා දී තිබේ) එහි පරිමාව මනා ලෙස පෙන්නුම් කළ අවස්ථාවක් ලෙස නව අධ්‍යාපන සේවා වැඩසටහන් නවතා දැමීම දැක්විය හැකි ය. මෙහි දී පෙන්වා දිය හැකි කාරණයක් වන්නේ විෂයභාර ඇමතිවරයා ගේ මැදිහත් වීම මෙන්ම, රටේ පැවති සමකාලීන දේශපාලන තත්වයන් ද ඊට සම්බන්ධ වූ බව යි.

නව අධ්‍යාපන සේවය යටතේ නොවිධිමත් අධ්‍යාපන සේවා වැඩසටහන් (NEEP) ගණනාවක් 1994 ජුනි මාසයේ සිට ප්‍රචාරය කෙරිණි. 1994 අගෝස්තු මස නව රජයක් බලයට පත් වීමෙන් පසු විවිධ අවස්ථාවල මෙහි විකාශනයන්ට යම් යම් බලපෑම් එල්ල විය. 1994 නොවැම්බර් ජනාධිපතිවරණ සමයේ එහි ප්‍රධාන අපේක්ෂකයකු වූ එක්සත් ජාතික පක්ෂයේ ගාමිණී දිසානායක ඝාතනයට ලක්විය. ඔහුගේ අවමඟුලේ සජීවී ප්‍රචාරය ගුවන්විදුලි සංස්ථාව සහ රූපවාහිනී සංස්ථාව මඟින් ලබා නොදීම පිළිබඳ නව අධ්‍යාපන සේවයේ වැඩසටහනක් ප්‍රචාරය කෙරිණි. විවිධ මත ඉදිරිපත් වන ආකාරයෙන් එම ක්‍රියාවලිය පිළිබඳ අදාළ වැඩසටහනින් කරුණු ඉදිරිපත් කෙරිණි. විෂය භාර ඇමතිවරයා, රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයා, දේශපාලන පක්ෂ නායකයින්, සන්නිවේදන කථිකාචාර්යවරුන් වැනි විවිධ පිරිස් ඊට සම්බන්ධ වුණි. මෙම වැඩසටහන් මඟින් පැවති රජයේ ජනමාධ්‍ය හා සම්බන්ධ ඇතැම් ක්‍රියාවන් විවේචනයට ලක්වුණි.

මෙම වැඩසටහනේ දී රාජ්‍ය පාර්ශවයේ මතය වූයේ ජනාධිපතිවරණ අපේක්ෂකයකුගේ අවමඟුලක පැවැත්වෙන කතා දේශපාලන මුහුණුවරකින් යුක්ත වන බැවින් ඒවා ප්‍රචාරය කිරීම මැතිවරණ නීතිය උල්ලංඝනය කිරීමක් වන බව යි.

1995 පෙබරවාරි මස 06 වන දින අධ්‍යාපන සේවා වැඩසටහන් හදිසියෙන් නවතා දමනු ලැබුයේ කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ය. එවකට සිටි කර්මාන්ත ඇමතිවරයා සහ වැඩ වර්ජිත කම්කරුවන් පිරිසක් දුරකථනය ඔස්සේ සම්බන්ධ කර ගනිමින් වැඩසටහන සජීවීව විසුරුවා හරින අවස්ථාවේ ම ප්‍රචාරය කිරීම නවතමින් නව අධ්‍යාපන සේවා වැඩසටහන් අත්හිටුවන ලදී. එම වැඩසටහනේදී කම්කරුවන් ප්‍රකාශ කර සිටියේ ඇමතිවරයා බලයට පත්වීමට පෙර තම ප්‍රශ්නය විසඳීමට පොරොන්දු වී ඇති නමුත් පසුව ඉන් මගහරිනු ලැබූ බවය. "කම්කරු ප්‍රජාව" නමැති වැඩසටහන අතරතුර ගුවන්විදුලි පාලකයින්ගේ ලැබුණු නියෝග මත මේ තත්ත්වය ඇති වුණි.

නව අධ්‍යාපන සේවා වැඩසටහන් හදිසියේ අත්හිටුවීම පිළිබඳ ව එහි ශ්‍රාවකයකු වූ විමල් ප්‍රනාන්දු ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් කඩවීම පිළිබඳ දක්වමින් නඩු පවරා තිබුණි. එහි දී ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය වූයේ ක්‍රියාකාරී අසන්නකුගේ භාෂණයේ අයිතිය උල්ලංඝනය වී ඇති බව යි. (පුංචිහේවා, 1996, 34) එම අසන්නාට වන්දියක් ලැබුණුමුත් එම සේවාව නැවත ස්ථාපිත කිරීමට අදාළ නියෝගයක් නඩු තීන්දුවේ නොතිබීම බරපතළ අඩුපාඩුවකි.

### කොටි හඬ (Voice of Tigers - VOT) සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම

ගුවන්විදුලි නාලිකා සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය පිළිගත් හා පැහැදිලි ප්‍රතිපත්තියකින් තොර ව පක්ෂපාතිත්වය මත ක්‍රියාත්මක වන්නක් යන්නට වඩාත් අවධාරණය වූ අවස්ථාවකි. එනම්, එතෙක් නීති විරෝධී තත්ත්වයක් යටතේ ක්‍රියාත්මක ව පැවැති එල්.ටී.ටී.ඊ සංවිධානයේ "කොටි හඬ" ගුවන්විදුලියට 2003 ජනවාරි මස රජය මගින් බලපත්‍රයක් නිකුත් කිරීම යි. එම සංවිධානයේ අරමුණ වූයේ ඔවුන්ගේ සාම වැඩපිළිවෙළ පිළිබඳව ජනතාව දැනුම් වත් කිරීමට එවැනි නිල ගුවන්විදුලියක් අවශ්‍ය වන බව යි. (Jayawardena,2003,83 ) අනෙක් අතට රජය රැගෙන යන වැරදි ප්‍රචාරවලට පිළිතුරු සැපයීම ද අරමුණු වූ බව පැවසේ.

"The VOT staff admits that they broadcast LTTE propaganda but argues that the Sri Lankan government does the same through the state radio and News-papers. To counter their so-called false propaganda, the Voice of Tigers aims an hourly Sinhalese newscast at the LTTE's traditional enemy the Sri Lankan soldiers stationed in the Tamil region.." (Jayawardena, 2003, 82)

බලපත්‍රය ලබා දීමේ දී රජය පැහැදිලි ප්‍රතිපත්තියක් අනුගමනය නොකළ බව ට පෙන්වා දුන් අය අතර මහනුවර ශ්‍රී දළදා මාළිගයේ දියවඩන නිලමේ නෙරංජන් විජේරත්න ද විය. VOT සඳහා බලපත්‍රය ලබා දීමට මාස කීපයකට පෙර ඔහු මධ්‍යම පළාත කේන්ද්‍ර කරගත් බෞද්ධ ගුවන්විදුලි නාලිකාවක් ඇරඹීමට අයදුම්පත් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවටත්, ජනසන්නිවේදන අමාත්‍යාංශයටත් ඉදිරිපත් කර තිබුණි. එම අයදුම්පතට පිළිතුරු ලිපියක් එවූ අමාත්‍යාංශ ලේකම්වරයා දැනුම් දෙනු ලැබුයේ ගුවන්විදුලි සේවා සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය රජය අත්හිටුවා ඇති බව යි. ඒ අනුව බලපත්‍රයක් ලබාදිය නොහැකි බව පෙන්වා දී තිබුණි.

මේ සම්බන්ධයෙන් පාර්ශව කිහිපයක් අධිකරණයට පෙත්සම් ඉදිරිපත් තිබුණි. කෙසේ වුවද එම ක්‍රියාවලියට මැදිහත් වූ එවකට ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ඔස්ටින් ප්‍රනාන්දු VOT සඳහා බලපත්‍රය නිකුත් කිරීම සුබවාදී ක්‍රියාවක් ලෙස තහවුරු කර තිබුණි.

"…Even with a contrary court order I still believe with out any disrespect to such court that establishing the LTTE radio was a positive action." (Feranndo, 2008, 723)

2009 දී VOT මධ්‍යස්ථානය ගුවන් හමුදාව මඟින් ප්‍රහාර එල්ල කර විනාශ කළ අතර රජයෙන් බලපත්‍රයක් නිකුත් කළ ගුවන්විදුලි නාලිකාවකට ගුවන් හමුදා ප්‍රහාරයක් එල්ල කිරීම සම්බන්ධයෙන් UNESCO සංවිධානයේ ප්‍රධානියා ද නිවේදනයක් නිකුත් කර තිබුණි.

### ඌව ප්‍රජා ගුවන්විදුලිය හා 2004 මහ මැතිවරණය

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව යටතේ ක්‍රියාත්මක වන ඌව ප්‍රජා ගුවන්විදුලිය සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැපයුවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මඟිනි. (UNDP) ඊට අවශ්‍ය පුහුණුව හා තාක්ෂණික ආධාර යුනෙස්කෝ සංවිධානය මගින් සැපයිණි. පාලනය හා නඩත්තු කටයුතු ඌව පළාත් සභාව යටතේ පැවතුණි.

ආරම්භයේ දී ගුවන්විදුලි සංස්ථාව මගින් පාලකවරයකු ඒ සඳහා පත් කරන ලදී. 2004 මහ මැතිවරණයේ දී ගුවන්විදුලියේ වැඩසටහන් වල අන්තර්ගතය පාලක පක්ෂයට අවශ්‍ය ආකාරයට සකස්කර ගැනීමට

පාලකවරයාට සහ ඌව පළාත් සභාවේ ආණ්ඩු පක්ෂ නියෝජිතයිනට අවශ්‍ය විය. එහෙත්, එහි සන්නිවේදකයින් කටයුතු කිරීමට පුහුණු කර තිබුණත් මාර්ගෝපදේශකයන්ට අනුව ය. වැඩසටහන් අන්තර්ගතය තුළ එකී මාර්ගෝපදේශ රැකීමට ඔවුහු උත්සාහ ගත්හ.

පළාත් සභාවේ හා පාලකවරයාගේ අරමුණු වූයේ දේශපාලන ප්‍රචාරණ කටයුතුවලට ප්‍රජා ගුවන්විදුලිය යොදා ගැනීම යි. අවසානයේ දී සන්නිවේදකයින් වැඩවර්ජනයක් කරමින් දේශපාලන ප්‍රචාරයෙන් වැලකිණි.

මැතිවරණය අවසානය වන තෙක් විකාශ කාලය සඳහා ගීත යොදා ගන්නා ලදී. ප්‍රජාවකගේ අවශ්‍යතා වෙනුවෙන් කටයුතු කිරීමට සකස් කර  ගත් කුඩා ප්‍රමාණයේ මාධ්‍යයට පවා හිමිකාරිත්වය බලපෑම් කරන ආකාරයට මේ සිද්ධිය මගින් මනාව වටහාගත හැකිය.

පාලකවරයා සහ සන්නිවේදකයින් අතර වැඩසටහන්කරණය පිළිබඳ ගැටලු මතු වූයේ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව මගින් විකාශය කළ "සුභාරතී" දේශපාලන සංවාද  වැඩසටහන ඌව ප්‍රජා ගුවන්විදුලිය තුළින් ද විකාශය කිරීමට නියෝග කිරීමේ සිද්ධියත් සමග ය. නියමිත පරිදි වැඩසටහන් ඉදිරිපත් කරන්නාට ඌව ප්‍රජා ගුවන්විදුලිය සමග සුභාරතිය සම්බන්ධ කරන මෙන් පාලකවරයා නියෝග කර තිබේ. මාර්ගෝපදේශ අනුව එසේ කළ නොහැකි බවට සන්නිවේදකයා පැවසූ විට ඔහුට මරණීය තර්ජන කර තිබුණි. පසුව ඌව ප්‍රජා  ගුවන්විදුලියට සුභාරතී වැඩසටහන සම්බන්ධ කළ නමුත් ශ්‍රාවකයින් දිගින් දිගටම දුරකථන ඇමතුම් ලබා දෙමින් එය විකාශය නොකරන ලෙස ඉල්ලා සිටි බව ඌව ප්‍රජා ගුවන්විදුලියේ සන්නිවේදකයා පෙන්වා දෙයි. පසුව ඔහු මාර්ගෝපදේශ අනුව ශ්‍රාවක ප්‍රතිචාර මත වැඩසටහන නවතා දැමූ බවට ලොග් සටහනක් ද තබා සාමාන්‍ය වැඩසටහන් විසුරුවා හරින ලදී.

**රජ එෆ්. එම්. ගුවන්විදුලිය තහනම් කිරීම.:-**

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනත යටතේ අදාළ විෂය භාර ඇමතිවරයාට පෞද්ගලික ගුවන්විදුලි සේවා තහනම් කිරීමට ඇතැම් අවශ්‍ය බලතල පවතී, එසේ වුව එම බලතල බොහෝවිට ක්‍රියාත්මක වනුයේ පක්ෂපාතී ස්වරූපයකිනි. එනම්, පෞද්ගලික ගුවන්විදුලි සේවා යටපත් කිරීම හා පාලනය කිරීමට ගන්නා එක් උත්සාහයක් ලෙසිනි.

මෙහි පසුබිම වනුයේ දේශපාලනික නොවන කාරණාවකි. රජ එෆ්. එම්. 2006 නොවැම්බර් 09 වන දින තහනමට ලක් කරනුයේ එහි විකාශය වූ "සුමාලි සමඟ පැය 3ක්" නම් වැඩසටහන සමාජ විරෝධී හා අසභ්‍ය ගණයේ වැඩසටහනක් බව සලකමිනි. එම නාලිකාව තහනම් කරමින් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ඉදිරිපත් කළ ප්‍රවෘත්ති නිවේදනයේ මේ තත්ත්වය තවදුරටත් විග්‍රහ කර තිබේ.

"ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය මඟින් මෙම වැඩසටහන් රාශියක් නිරීක්ෂණය කරන ලදී. මෙහි දී මෙම ගුවන්විදුලි වැඩසටහන් මඟින් පිළිගත් මූලික සමාජ සම්මතයන් මෙන්ම පොදුවේ පිළිගත් ආචාරධර්මවලට කිසිසේත් එකඟ නොවන්නා වූත්, පිළිකුල් සහගත ජුගුප්සාජනක දෙබස් ඇතුළත් ගුවන්විදුලි වැඩසටහන් ප්‍රචාරය කර ඇති බව තහවුරු විය."

අදාළ නිවේදනයේ සඳහන් කරුණු පිළිගත හැකි මුත් මෙවන් ආකාරයේ වැඩසටහන් සකස් කිරීම සඳහා පිළිගත් නිර්නායක හෝ ආචාරධර්ම පද්ධතියක් නොපැවතී ම මත ඕනෑම ආකාරයක වැඩසටහනක් සකස් කිරීමේ හැකියාව ගුවන්විදුලි සේවා සඳහා පවතී.

මෙම තහනම මඟින් මතු වන තවත් ගැටලුවක් වන්නේ ඉතා කෙටිකාලයක් තුළ එම තහනම් කරන ලද නාලිකාව රන් එෆ්. එම්. නමින් විකාශන කටයුතු නැවත ඇරඹීම යි. පෙර ලබා දී තිබූ සංඛ්‍යාත ඔස්සේ ම එම නාලිකාවේ වැඩසටහන් විකාශනය විය. නව නාලිකාවක් ආරම්භ කරනුයේ ද කිසිදු ආචාරධර්ම තත්ත්වයක් නැවත ඇති කිරීමෙන් පසුව නොවේ. එබැවින් පෙර සිදු කළ වරද නැවත කිරීමට ඉඩකඩක් තවදුරටත් පවතී. නැවත නාලිකාවක් ඇරඹීමට ඉඩකඩ සැපයීම පෞද්ගලික ව්‍යාපාරික සබඳතා මඟින් සිදු කරන ලද්දක් බව පෙනී යයි.

## ABC මාධ්‍ය ජාලය තහනම් කිරීම

ABC මාධ්‍ය ජාලය තහනම් කිරීමේ සිද්ධිය ප්‍රවෘත්ති වාර්තාකරණය හා සම්බන්ධ ව පවතී. එනම්, 2007 ඔක්තෝබර් 24 වන දින රාත්‍රී හදිසි ප්‍රවෘත්තියක් ලෙස රන්මිණිතැන්න ගමට කොටි ත්‍රස්තවාදීන් පැමිණ ඇති බවට පළ කළ ප්‍රවෘත්තිය යි. අනෙකුත් නාලිකා මෙම ප්‍රවෘත්තිය පළකළ නමුදු ABC ජාලය, හිරු එෆ්.එම්. නාලිකාව ගම්වාසීන් ආරක්ෂක ස්ථාන කරා ගමන් කිරීම ඉස්මතු කර ඇත.

රජය එම ප්‍රවෘත්තිය මත පදනම් ව ගුවන්විදුලි සංස්ථා පනත යටතේ ඇති බලතල මත ABC මාධ්‍ය ජාලය තහනම් කරන ලදී. මෙහි දී සිදුවූයේ ද තමනට අවතන කරගත නොහැකි පෞද්ගලික ගුවන්විදුලි නාලිකාවක් ප්‍රවෘත්ති වාර්තාකරණයේ දී සිදු කළ වරදක් මත පදනම් ව නීතිමය ක්‍රියාදාමයකට හසුකිරීම යි.

පසුව 2008 අප්‍රේල් 14 වන දින සිට ABC මාධ්‍ය ජාලය නැවත ක්‍රියාත්මක වීමට අදාළ අවසරය හිමිවනුයේ ඊට අදාළ නීතිමය පසුබිම මඟින් නොව පුද්ගලික වශයෙන් රජය හා සිදු කළ ගනුදෙනු මඟිනි.

මේ සිදුවීම් දෙක මඟින් පෙනෙනුයේ අදාළ නාලිකා තහනම් කිරීම දේශපාලන පක්ෂපාතිත්වය මත පදනම් ව සිදු කරනු ලබන බව යි. ඒවා වැරදි ලෙස දක්වීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කර ඇත්තේ ද රජය මඟිනි. මාධ්‍ය පාලනය හා ආචාරධර්ම පිළිබඳ නිසි ඇගයීමක් නොමැති පරිසරයක් තුළ එවැනි වැරදි ඕනෑම ආකාරයකට සිදු විය හැකි ය.

## සමාලෝචනය

ඕනෑම ජනමාධ්‍යයක පැවැත්ම හා එහි වෘත්තිමයභාවය ආරක්ෂා වන්නේ ඒ සඳහා පනවන ආචාරධර්ම පද්ධතියක් මඟිනි. එවැනි එකඟතාවක් නොමැති පරිසරයක් තුළ මාධ්‍ය වාරණයකට ඉඩකඩ විවර විය හැකිය. එබැවින් රාජ්‍ය මැදිහත්වීම්වලට පෙර ස්වයං නියාමන ක්‍රමවේදයකට මෙරට විද්‍යුත් මාධ්‍ය යොමුවීමේ වැදගත්කම මතු කර දක්විය හැකිය.

## මූලාශ්‍ර


- *කොළඹගේ, ඩී. ඇම්.- (1980), ගුවන් විදුලි වංශය, සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ*
- *පුංචිහේවා, එස්. පී. භාෂණයේ අයිතිය; නඩු තීන්දුව -(පරි), (1996), MDDR*
- *පෙරේරා, සුනිල් සරත් - (2007), විද්‍යුත් මාධ්‍යෝපදේශ විග්‍රහය, සරසවි, නුගේගොඩ*
- *Fernando; Austin (2008) My Belly is white; Vijitha yapa; Colombo.*
- *Gunasekara H. M. (1997); Media as Bridge Maker; Friedrich - Ebert – Stiftung*

- *Gunawardana; Pujith C L; (1990) This is Colombo Calling; Perali Publishers.*
- *Jayawardena; Shani (2003) Radio in Sri Lanka, Media Development Loan Fund www.mdlf.org*
- *Karunanayake; Nandana; (1990)Broadcasting in Sri Lanka; Potential and Performance ; C M P S; Sri Lanka.*
- *Report of the Commission of Inquiry on the Ceylon Broadcasting Corporation (December; 1972) Department of Government Printing; Sri Lanka*
- *Report of the Commission on Broadcasting - 1953 (July; 1955); Government Press Ceylon*
- *Report of the Commission on Broadcasting and Information; (May 1966); Government Press Ceylon*
- *Report of the Special Committee on Broadcasting in Ceylon (June; 1941); Government Press Ceylon*
- *Selvakumaran. N; Edirisinha; Rohan; (1995) Mass Media Laws Regulation in Sri Lanka; AMIC; Singapore*
- *Senadhira; Sugeeswara P; (1996); Under Siege; Mass Media in Sri Lanka; Segment Books; New Delhi.*
- *Silva; M A de and Siriwardena; Reggie; (1977); Communication Policies in Sri Lanka*

  *UNESCO*